[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

2019.12.10 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ ඇසුරෙන් අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) කපුරාළ : "ගුරුන්නාන්සේ, අර කියපු විදියට අපි ගියා ඇතෙක් හොයන්න. ඒත් වැඩි වෙලා යන්න ඉස්සර අපට තිබහ දැනුණා. අනේ ගුරුන්නාන්සෙ, වතුර බින්දුවක් නෑ කොහේවත්. මම කොට්ටෝරුවා පිටත් කරලා වතුර ටිකක් ගේන්නෙයි කියල එතන වාඩිවෙලා උඩ බැලුවා"

(B) ත්‍රෛලෝක්‍ය සුපූජිත සකල බඹ සුරනරන් සැදූ මත පාකම ල්
ත්‍රෛකාල වර්ජිත වූ හේතු ප්‍රත්‍ය ධර්ම ස්වයම්භූ ඥානයෙන් දත් සිය ල්
ත්‍රෛමූල පාපාන්ධකාරයන් නසන ප්‍රතිපත්ති මග දෙසූ නිම ල්
ත්‍රෛවාර සකස් කොට භක්ති ප්‍රේමාදරෙන් මුනිඳු නමදිමු තුමූ ල්

(C) ගුරුන්නාන්සේ: දොඩවන බාසාවක් නැද්ද කියලයි අහන්නෙ.
බමුණා: දේව බාසං අත්ථි. මේ මනුස්සානං නත්ථි. මේ තෙලිඟු බාසායං අත්ථි.

(D) සොක්කා එන්නේ දෙවනුව නැටුම් නටන්නේ
දැක්කා උන්නේ සෙල්ලම් යසයි කියන්නේ
බක්කා ඉන්නේ නැටුමට මමයි කියන්නේ
සොක්කා දන්නේ නැටුමට බිම පෙරළෙන්නේ

**1.** උඩරට පැරණි ගැමි නාටකයක් හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**2.** ගම්මඩු ශාන්තිකර්මය හා සම්බන්ධ ව ඇත්තේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**3.** සූනියම් යාගය හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**4.** ඔපෙරාවක මූලික අංගය වන්නේ කුමක් ද?
(1) නර්තනය (2) ගායනය (3) රංගාලෝකය (4) රංග වින්‍යාසය

[දෙවැනි පිටුව බලන්න.

**5.** නාට්‍ය කලාව සෙසු ප්‍රාසංගික කලාවන් ගෙන් වෙනස් වන්නේ පහත දැක්වෙන කුමන අංගයක් යොදාගන්නා බැවින් ද?
(1) වේෂභූෂණ (2) රංගාලෝකය (3) සතර අභිනය (4) රංගභූමි අලංකරණය

**6.** නෘත්‍ය යනු,
(1) අංග වික්ෂේප පමණක් ඇති රිද්මයානුකූල නැටුමකි.
(2) කිසියම් අර්ථයක් දැක්වෙන තාලාන්විත නැටුමකි.
(3) අංග වික්ෂේප පමණක් ඇති තාලාන්විත නැටුමකි.
(4) කිසියම් කතා පුවතක් නිරූපණය කරන රඟුම් ප්‍රභේදයකි.

**7.** ප්‍රාසංගික කලා ගණයට අයත් වන කාණ්ඩය තෝරන්න.
(1) සංගීත සන්දර්ශන, චිත්‍රපට දර්ශන, ඔපෙරා, ඉඟිනළු
(2) නර්තන දර්ශන, සංගීත සන්දර්ශන, ඔපෙරා, මුද්‍රානාට්‍ය
(3) චිත්‍ර ප්‍රදර්ශන, වේදිකානාට්‍ය, මුද්‍රානාට්‍ය, බැලේ
(4) වේදිකානාට්‍ය, ඔපෙරා, වීඩියෝ දර්ශන, ගීතනාටක

**8.** නාට්‍යයකට සංගීතය සැපයීමේ දී වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
(1) වාදන වෘන්දයේ සංඛ්‍යාව කෙරෙහි ය.
(2) පෙරදිග හා අපරදිග සංගීත භාණ්ඩ එක සමාන ව යොදාගැනීම කෙරෙහි ය.
(3) තේමාවට හා ශෛලියට ගැළපෙන අයුරින් නිර්මාණය කිරීමට ය.
(4) ප්‍රේක්ෂකයන් ගේ රුචිකත්වයට අනුව නිර්මාණය කිරීමට ය.

**9.** සංවාද, අංග චලන, ශෝකී බව, නාට්‍යෝපකරණ යනාදියට අදාළ අභිනය සතර පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) වාචික, ආංගික, සාත්ත්වික, ආහාර්ය (2) සාත්ත්වික, ආංගික, වාචික, ආහාර්ය
(3) වාචික, සාත්ත්වික, ආංගික, ආහාර්ය (4) ආංගික, ආහාර්ය, වාචික, සාත්ත්වික

**10.** ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් සේ සැලකෙන්නේ,
(1) රඟපෑම අතිශයෝක්තියෙන් යුතු ව ඉදිරිපත් කිරීම යි.
(2) සැබෑ ලෝකයට සමාන අයුරින් අභිනය පෑම යි.
(3) ප්‍රකෘති ලෝකය කාල්පනික විලාසයකින් මවා පෑම යි.
(4) සිදුවීම් ශෛලිගත ආකාරයට ඉදිරිපත් කිරීම යි.

**11.** නාට්‍යයක් රඟ දක්වන විට අනිවාර්යයෙන් ම සිටිය යුත්තේ කවුරුන් ද?
(1) නාට්‍ය අධ්‍යක්ෂවරයා සහ නළු-නිළියන් (2) නළු-නිළියන් සහ ප්‍රේක්ෂකයන්
(3) ප්‍රේක්ෂකයන් සහ ගායන ශිල්පීන් (4) ගායක ශිල්පීන් සහ නළු-නිළියන්

**12.** පින්තූර රාමු වේදිකාවකට මූලික වශයෙන් රංගාලෝකය අවශ්‍ය කුමක් සඳහා ද?
(1) දර්ශනය විචිත්‍රවත් කරගැනීමට
(2) වේදිකාවේ වර්ණ වෙනස් කිරීමට
(3) මනා ප්‍රේක්ෂාවක් ඇති කරගැනීමට
(4) අඳුර දුරු කරගැනීමට

**13.** වේෂභූෂණ නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ නාට්‍යයේ,
(1) රංග කාලය යි. (2) රංග ශෛලිය යි. (3) රංග ආකෘතිය යි. (4) චරිත සංඛ්‍යාව යි.

**14.** අංගරචනා ශිල්පියා නළුවන් අංගරචනය කිරීමට පෙර,
(1) පදනම් ආලේපය මුහුණේ තැවරිය යුතු ය. (2) මුහුණට ගැළපෙන වර්ණ තෝරාගත යුතු ය.
(3) මුහුණ මත රේඛා ලකුණු කරගත යුතු ය. (4) පූර්ව-සැලසුම් චිත්‍ර ඇඳගත යුතු ය.

**15.** අභිරූපණ රංගනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අංග දෙක කුමක් ද?
(1) ආංගිකාභිනය සහ වාචික අභිනය
(2) සාත්ත්වික අභිනය සහ රංග භූමි අලංකරණය
(3) අංග රචනය සහ නාට්‍යෝපකරණ
(4) ආංගිකාභිනය සහ සාත්ත්වික අභිනය

[තුන්වැනි පිටුව බලන්න.

**16.** රංග වින්‍යාසය යනු වේදිකා අවකාශය තුළ නළු-නිළියන්
(1) රංගනයේ යෙදවීම යි.
(2) ස්ථානගත කරවන ආකාරය යි.
(3) ගමන් කරවන ආකාරය යි.
(4) රිද්මයානුකූල ව චලනය කරවීම යි.

● පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/ අනුවර්තනය | මෙරට නිෂ්පාදක/ පරිවර්තක |
|---|---|---|---|
| A | මැක්සිම් ගෝර්කි | හිරු නැති ලොව | රංජිත් ධර්මකීර්ති |
| යෙර්මා | ගාර්ෂියා ලෝර්කා | B | ගුණසේන ගලප්පත්ති |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හිත හොඳ අම්මණ්ඩි | C |
| ද ග්ලාස් මෙනාජරි | D | අහස් මාලිගා | හෙන්රි ජයසේන |

**17.** ඉහත වගුවේ A කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) වේටිං ෆෝ ගොඩෝ
(2) ඇපල් කාර්ට්
(3) රන් ෆෝ යුවර් වයිෆ්
(4) ද ලෝවර් ඩෙප්ත්ස්

**18.** ඉහත වගුවේ B කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන නාට්‍යයේ නම කුමක් ද?
(1) උත්තමාවී (2) ලියතඹරා (3) මූදු පුත්තු (4) දේවතා එළි

**19.** ඉහත වගුවේ C කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක ගේ නම කුමක් ද?
(1) සුගතපාල ද සිල්වා
(2) බන්ධුල ජයවර්ධන
(3) දයානන්ද ගුණවර්ධන
(4) සයිමන් නවගත්තේගම

**20.** ඉහත වගුවේ D කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය රචකයා කවු ද?
(1) බර්නාඩ් ෂෝ (2) ටෙනසී විලියම්ස් (3) ජ්ලෝටස් (4) ඇන්ටන් චෙකෝව්

**21.** ගගනිකාවේ සඳක් මවා පෙන්වීමට අවශ්‍ය කරන පහන කුමක් ද?
(1) ධාරාලෝක පහන
(2) අල්ට්‍රා වයලට් පහන
(3) ප්‍රක්ෂේපණ තිත් පහන
(4) හැලොජන් පහන

**22.** ශරීරාංග සැහැල්ලු කිරීමට උපකාර වන්නේ කුමක් ද?
(1) ශිථිලකරණ අභ්‍යාස
(2) ශ්වසන අභ්‍යාස
(3) සංවේදන අභ්‍යාස
(4) කටහඬ අභ්‍යාස

**23.** නාට්‍ය පෙළ රචනයේ දී,
(1) ගීත මගින් පරිසරය පමණක් වර්ණනා කළ යුතු ය.
(2) චරිත නොවෙනස් වන අයුරින් නිරූපණය කළ යුතු ය.
(3) හැමවිට ම කතාවේ මුල මැද අග සිද්ධි අනුපිළිවෙළට තිබිය යුතු ය.
(4) චරිතවල අරමුණු හෙළිවන ආකාරයට සංවාද සැකසිය යුතු ය.

**24.** නාට්‍යෝපකරණ සැදිය යුත්තේ,
(1) දීප්තිමත් වර්ණ හා චිත්තාකර්ෂණීය බව සලකා ය.
(2) දිලිසෙන සුළු වර්ණවත් අමුද්‍රව්‍යවලින් ය.
(3) පහසුවෙන් අඩු මිලට ලබාගත හැකි අමුද්‍රව්‍යවලින් ය.
(4) නළුවන් ගේ රංග කාර්යයට උපකාර වන ආකාරයට ය.

[හතරවැනි පිටුව බලන්න.

● පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **25** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

**25.** ගුණසේන ගලප්පත්තිගේ මූදු පුත්තු නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** රංග රචනය සම්බන්ධ ව ප්‍රවීණතාව උසුලන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**27.** මනමේ නාට්‍ය ප්‍රථම නිෂ්පාදනය හා සම්බන්ධ වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.


**28.** ඉහත සඳහන් ඡායාරූප අතුරෙන් මේස, මෝදර මෝල වැනි නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**29.** ලොව වඩාත් ප්‍රකට අභිරූපණ ශිල්පියකු ලෙස නම් දරා සිටින්නේ,
(1) රොබට් ඩී. නීරෝ ය. (2) ලියනාඩෝ ඩී කැප්රියෝ ය.
(3) රෝවන් සෙබස්ටියන් ය. (4) මාර්ෂල් මාෂෝව් ය.

**30.** විශ්වනාත් ලෞජි විසින් සංගීතය සපයන ලද නූර්තිය කුමක් ද?
(1) වෙස්සන්තර (2) දුටුගැමුණු (3) ශ්‍රී වික්‍රම (4) සිරිසඟබෝ

**31.** කෝලම් නාටකයක අපර රංගය ආරම්භ වන්නේ,
(1) රජු හා බිසව ගේ සම්ප්‍රාප්තියත් සමග ය.
(2) හේවා කෝලම සබයෙන් නික්මයාමත් සමග ය.
(3) අණ බෙර කෝලම සබයට පිවිසීමෙන් අනතුරු ව ය.
(4) මල් පැළ පහන් දැල්වීම සහ දේවාරාධනා කවි ගායනයෙන් පසු ව ය.

● පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් අංක **32** සිට **33** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B

**32.** A හා B යන වෙස් මුහුණු අනුපිළිවෙළින්,
(1) සන්නි මුහුණක් හා කෝලම් මුහුණකි. (2) කෝලම් මුහුණක් හා සන්නි මුහුණකි.
(3) සන්නි මුහුණු දෙකකි. (4) කෝලම් මුහුණු දෙකකි.

**33.** ඉහත වෙස් මුහුණු අතුරෙන් එක් වෙස් මුහුණකින් සංකේතවත් කරන ආබාධය කුමක් ද?
(1) පාචනය (2) අන්ධ බව
(3) උණසන්නිපාතය (4) බිහිරි බව

**34.** නළුවකු විසින් කිසියම් රඟපෑමක් සාර්ථක ව ඉදිරිපත් කිරීමට නම් පිටපත කියවා,
(1) රංග විධාන ඒ අයුරින් ම පිළිපැදිය යුතු ය.
(2) චරිතයේ භූමිකා හඳුනාගත යුතු ය.
(3) රංග අභ්‍යාස ප්‍රගුණ කළ යුතු ය.
(4) වේෂභූෂණ හා අංග රචනය ගැන සැලකිලිමත් විය යුතු ය.

[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

48357

**35.** දික්තල කාලගෝල නාට්‍යයේ සංවාද උච්චාරණය කළ යුත්තේ,
(1) සාමාන්‍ය ජීවිතයේ මිනිසුන් කතාබහ කරන ආකාරයෙනි.
(2) සොකරි නාටකයේ කවි ගායනා කරන විලාසයෙනි.
(3) කිසියම් රිද්මයකට අනුව ශෛලිගත ස්වරූපයෙනි.
(4) ලෝකධර්මී ශෛලියට අනුව ය.

**36.** කැරකෙන වේදිකාවක් දක්නට ඇත්තේ,
(1) ග්‍රීක ඇරීනා රංග භූමියේ ය.
(2) එංගලන්ත ග්ලෝබ් රඟහලේ ය.
(3) ජපන් කබුකි වේදිකාවේ ය.
(4) කොළඹ නෙළුම් පොකුණ රඟහලේ ය.

**37.** කෙටි නාට්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,
(1) ජවනිකා ගණනාවකින් යුක්ත වීම යි.
(2) නාට්‍යෝපකරණ කිසිවක් නොයොදා ගැනීම යි.
(3) රංග වින්‍යාසය උපරිම අයුරින් යොදාගැනීම යි.
(4) බොහෝ විට එක් අංකයකට පමණක් සීමා වීම යි.

● පහත සඳහන් නාට්‍ය හය ඇසුරෙන් අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දෙවැනි මහින්ද
B - වෙද හටන
C - පිටිසර කෙල්ල
D- වැරදුණු කුරුමානම
E - කපුවා කපෝති
F- කඩවුණු පොරොන්දුව

**38.** සිරිසේන විමලවීර ගේ නාට්‍ය නිර්මාණයක් වන්නේ කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**39.** මිනර්වා නාට්‍යවලට අයත් වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) D හා E පමණි. (4) D හා F පමණි.

**40.** ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල සමිතිය විසින් රඟ දක්වනු ලැබූ නාට්‍ය වන්නේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) B හා E පමණි. (4) D හා E පමණි.

* *

[ හයවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

**නාට්‍ය හා රංග කලාව I, II**
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(i) විකෘති නාට්‍යයේ ඇතුළත් දර්ශන සංඛ්‍යාව කීය ද? (ලකුණු 02 යි)
(ii) මෙම නාට්‍යයේ කතාව ගලායන කාල සීමාව වසර කීය ද? (ලකුණු 02 යි)
(iii) ප්‍රියංගනී දක්ෂතා දක්වන හැකියාවන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(iv) විකෘති නාට්‍යයේ දර්ශන සිදුවන ස්ථාන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(v) අවසාන ජවනිකාවේ ඇතුළත් නිශ්චිත පුද්ගල නාම නැති චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(vi) විකෘති නාට්‍ය පෙළ රචනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**2.** (i) නාට්‍යමය ලක්ෂණ ඇති පහතරට ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) එම ශාන්තිකර්ම පවත්නා ප්‍රදේශ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) ඉහත (i) හි සඳහන් කරන ලද ශාන්තිකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) රඟපෑම පුහුණු වීමේ දී නළු-නිළියන් විසින් ප්‍රගුණ කළ යුතු අංග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) රූපණ ශිල්පියකුට අවශ්‍ය ගුණාංග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) 'රූපණය' යනු කුමක් ද යි ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) අංගරචනයේ මූලික කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) අංගරචනා ශිල්පීන් භාවිත කරන අමුද්‍රව්‍ය **දෙකක්** සහ උපකරණ **දෙකක්** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) නාට්‍ය රඟ දැක්වීමේ දී අංගරචනය අවශ්‍ය වන්නේ ඇයි ද යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) සොකරි රඟ දැක්වෙන ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) සොකරි නාට්‍යයේ ඇතුළත් වන ප්‍රධාන චරිත **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) සොකරි නාටකයේ රංග ශෛලිය කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) හෙන්රි ජයසේන රංගනයෙන් දායක වූ වේදිකා නාට්‍යයක නම හා ඔහු රඟ පෑ චරිතය සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) හෙන්රි ජයසේන නිෂ්පාදනය කළ ස්වතන්ත්‍ර නාට්‍ය **හතරක්** **නම්** කරන්න. (ලකුණු 04 යි)
(iii) හෙන්රි ජයසේන ගෙන් දේශීය නාට්‍ය කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

**7.** පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

චතුරි විද්‍යා විෂයන් ඉගෙනගැනීමට කැමති ය. ඇගේ බලාපොරොත්තුව අනාගතයේ වෛද්‍යවරියක වීම යි. චතුරි ගේ නංගි සෙනුරි සංගීතයට සහ නර්තනයට දක්ෂ ය. ඇගේ බලාපොරොත්තුව කලා අංශයෙන් ඉගෙනගෙන ගුරුවරියක වීම යි. තාත්තා සෙනුරිට විද්‍යා අංශයෙන් ඉගෙන ගන්නා ලෙස බල කරයි. අම්මා සෙනුරි ගේ කැමැත්තට පක්ෂ ව කතා කරයි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

※※※

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2019**
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

රහසායි

විෂයය අංකය / பாட இலக்கம் : 50

විෂයය / பாடம் : නාට්‍ය හා රංග කලාව

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 02 | 21. | 03 | 31. | 01 |
| 02. | 01 | 12. | 04 | 22. | 01 | 32. | 01 |
| 03. | 03 | 13. | 02 | 23. | 04 | 33. | 02 |
| 04. | 02 | 14. | 04 | 24. | 04 | 34. | 02 |
| 05. | 03 | 15. | 04 | 25. | 03 | 35. | 03 |
| 06. | 02 | 16. | 04 | 26. | 01 | 36. | 03 |
| 07. | 02 | 17. | 04 | 27. | 03 | 37. | 04 |
| 08. | 03 | 18. | 03 | 28. | 01 | 38. | 03 |
| 09. | 01 | 19. | 01 | 29. | 04 | 39. | 04 |
| 10. | 02 | 20. | 02 | 30. | 04 | 40. | 03 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை : $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி : $\frac{25}{40}$

PADANAMA PUBLICATION

# 50 - නාට්‍ය හා රංග කලාව

## II පත්‍රය - පිළිතුරු

1. විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) විකෘති නාට්‍යයේ ඇතුළත් දර්ශන සංඛ්‍යාව කීය ද? (ලකුණු 02 යි)
   (ii) මෙම නාට්‍යයේ කතාව ගලායන කාල සීමාව වසර කීය ද? (ලකුණු 02 යි)
   (iii) ප්‍රියංගනී දක්ෂතා දක්වන හැකියාවන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (iv) විකෘති නාට්‍යයේ දර්ශන සිදුවන ස්ථාන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (v) අවසාන ජවනිකාවේ ඇතුළත් නිශ්චිත පුද්ගල නාම නැති චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (vi) විකෘති නාට්‍ය පෙළ රචනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(i) 10 යි (දහයයි)

***(ලකුණු 02)***

(ii) වසර හතකි

***(ලකුණු 02)***

(iii) නර්තනයට හා ක්‍රීඩාවට (දිවීමට)

***(ලකුණු 02)***

(iv) ක්‍රීඩා පිටිය

නැටුම් පන්තිය (නැටුම් ගුරුතුමියගේ ගෙදර/සම්පත්ගේ ගෙදර)

ප්‍රියංගනී ගේ ගෙදර/සරණපාලගේ කාමරය/පාර අයිනේ කඩය/ජගත්ගේ නිවස/හිල්ඩාගේ කන්තෝරුව/විදුහල්පතිගේ කාර්යාලය/ශාස්ත්‍රකරුගේ වෙළඳසල (ශාස්ත්‍ර කියන ස්ථානය) / ටියුෂන් පොළ/ටියුෂන් ෆැක්ටරිය/ටියුෂන් පන්තිය/පාසල

**(ඉහත දැක්වෙන ස්ථාන අතුරින් දෙකක් සඳහන් කර ඇත්නම් ලකුණු 02 යි)**

(v) විදේශ මහත්තයා, ස්වදේශ මහත්තයා

***(ලකුණු 02)***

(vi)
- කෙටි දර්ශන ගණනාවකින් යුක්ත වීම
- ගද්‍ය සංවාද සමග ගීත යොදාතිබීම
- විවිධ තරාතිරම්වල චරිත රාශියක් අන්තර්ගත වීම
- කෙටි සහ සරල සංවාද යොදාතිබීම
- ආපසු බැල්මක් නමින් අතීත ආවර්ජන යොදාතිබීම

  (උදා :- සරණපාලගේ කථාව/ජගත්ගේ කථව )
- ඇතැම් අවස්ථා වාචික අභිනයෙන් තොර ව නිරූපණය කිරීම

  (උදා:- අටවන දර්ශනය)

**(ඉහත සඳහන් කරුණු දෙකක් දක්වා ඇත්නම් ලකුණු 02 යි)**

2. (i) නාට්‍යමය ලක්ෂණ ඇති පහතරට ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) එම ශාන්තිකර්ම පවත්නා ප්‍රදේශ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) ඉහත (i) හි සඳහන් කරන ලද ශාන්තිකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) රිද්දි යාගය (රටයකුම), සන්නි යකුම (දහඅට සන්නිය), සූනියම් යාගය, ගම්මඩුව, දෙවොල් මඩුව, මහසොහොන් සමයම,

***(ලකුණු 02)***

(ii) බෙන්තර,මාතර,ගාල්ල. අම්බලන්ගොඩ, වැලිගම, මිරිස්ස,දෙවුන්දර, බෙලිඅත්ත ආදී පහත රට ප්‍රදේශ හතරක් සඳහන් කර ඇත්නම් **(ලකුණු 04 )**

(iii) ඉහත (i) කොටසෙහි සඳහන් කරන ලද ශාන්ති කර්මවල දක්නට ලැබෙන පහත සඳහන් නාට්‍යමය ලක්ෂණ අතරින් තුනක් උදාහරණ සහිත ව විස්තර කර ඇත්නම් ලකුණු 06 යි

- අනුකරණය
- අනුරූපණය
- සමාරෝපය
- සංවාද භාවිතය
- චරිත නිරූපණය
- අවස්ථා නිරූපණය
- නාට්‍යෝපකරණ සහ රංග සැරසිලි භාවිතය
- වේෂභූෂණ භාවිතය
- ප්‍රේක්ෂක සහභාගීත්වය

3. (i) රඟපෑම පුහුණු වීමේ දී නළු-නිළියන් විසින් ප්‍රගුණ කළ යුතු අංශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) රූපණ ශිල්පියකුට අවශ්‍ය ගුණාංග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) 'රූපණය' යනු කුමක් දැ යි ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) ආභ්‍යන්තරික ප්‍රකාශනය (සිත)
බාහිර ප්‍රකාශනය (ශරීරය හා කටහඬ) **(ලකුණු 02 )**

(ii)
- ඉවසීම
- සමූහික ව කටයුතු කිරීම
- විනයානුකූල බව
- කැප වීම
- දැඩි ආත්මශක්තියකින් යුක්ත වීම
- අධිෂ්ඨානශීලිත්වය
- සංවේදීබව

**වැනි ගුණාංග හතරක් ලියා ඇත් නම් (ලකුණු 04)**

(iii) • චරිතයකට සමාරෝපය වී කිසියම් කාලසීමාවක් එම චරිතය තුළ ජීවත්වෙමින් ඊට අවශ්‍ය අනුකරණය සහ අභිනය පෑම රූපණ කාර්යය ලෙස දැක්විය හැකි ය. නැරඹූ නාට්‍යයක් ඇසුරින් ඉහත කී අදහස් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න

**(ලකුණු 06)**

**4.** (i) අංගරචනයේ මූලික කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අංගරචනා ශිල්පීන් භාවිත කරන අමුද්‍රව්‍ය **දෙකක්** සහ උපකරණ **දෙකක්** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) නාට්‍ය රඟ දැක්වීමේ දී අංගරචනය අවශ්‍ය වන්නේ ඇයි දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) සරල අංග රචනය

චරිතාංග අංග රචනය

**(ලකුණු 02 )**

(ii) **අමුද්‍රව්‍ය**

- පදනම් ආලේපන
- ලයිනින් කලර්ස්
- ටූත් ඉනැමල්
- නෝස් පොටි
- ස්පිරිට් ගම්
- ලිප්ස්ටික්
- රූජ් (කම්මුල් සායම්)
- ෆෑන් කේක්
- මේකප් පෙන්සිල්
- ටැල්ක් පවුඩර් / පවුඩර් පෆ්
- ක්‍රේප් හෙයා
- රිමූවිං ක්‍රීම්
- අයිබ්‍රෝ පෙන්සිල්

**උපකරණ**

- ස්පොන්ජ්
- කතුර
- පින්සල්
- පනාව
- කන්නාඩිය
- බුරුසු

**අමුද්‍රව්‍ය දෙකක් සහ උපකරණ දෙකක් නම් කිරීම සඳහා ලකුණු 04 යි**

(iii) • නළුවා රඟපාන චරිතයට අනුව ශරීර ලක්ෂණ බාහිර ව මතු කරදැක්වීමට

• රංගාලෝකය නිසා නළුවාගේ මුහුණේ ඇති වන පැතලි ස්වභාවය නැති කර ත්‍රිමාණ ගතිය මතු කරගැනීමට

• නළුවාගේ සමාරෝපණ කාර්යය පහසු කිරීමට

• නළු - නිළියන් විවිධ චරිත ලෙස වෙස් ගැන්වීමට (මිනිස්, සත්ත්ව, යක්ෂ, අද්භූත)

• චරිතවල විවිධ වයස් සීමාවන් මතු කරදැක්වීමට

• මුහුණේ උපාංග ඉස්මතු කිරීමට හෝ යටපත් කර දැක්වීමට (තොල්, ඇස්, ඇහි බැම්)

**වැනි කරුණු තුනක් විස්තර කර ඇත්නම් ලකුණු 06 යි**

5. (i) සොකරි රඟ දැක්වෙන ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) සොකරි නාට්‍යයේ ඇතුළත් වන ප්‍රධාන චරිත **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) සොකරි නාටකයේ රංග ශෛලිය කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) උඩුනුවර, යටිනුවර, හාරිස්පත්තුව, කටුගස්තොට, හේවාහැට , මාතලේ, සත්කෝරළය, හතරකෝරළය, කෑගල්ල, කුරුණෑගල ආදි ප්‍රදේශ දෙකක් නම් කර ඇත්නම්

**(ලකුණු 02 යි)**

(ii) සොකරි (සොකරි අම්මා) ගුරුහාමි, වෙදරාළ, පරයා, කාලී, සොත්තානා,

**(චරිත හතරක් නම් කර ඇත්නම් ලකුණු 04)**

(iii)
- කවි ගායනයට අනුව අනුරූපණ මාධ්‍යයෙන් කථාව ඉදිරිපත් කිරීම
- ගුරුන්නාන්සේ සහ ගායක කණ්ඩායම යොදාගැනිම
- සියලු ම චරිත පිරිමින් විසින් රඟපානු ලැබීම
- සරල වෙස් මුහුණු භාවිතය
- පද්‍යමය හා ගද්‍යමය සංවාද භාවිතය
- කමත රංග භූමිය ලෙස යොදාගැනීම
- නිදහස් අංගචලන සහ ගමන්විලාසය යොදාගැනීම
- රංග භූමිය වටා පරික්‍රමණය කරමින් රංගනයේ යෙදීම
- වේෂභූෂණ හා නාට්‍යෝපකරණ ගැමි පරිසරයෙන් සපයාගෙන භාවිතයට ගැනීම

**ආදි කරුණු තුනක් විස්තර කර ඇත් නම් ලකුණු 06 යි**

6. (i) හෙන්රි ජයසේන රංගනයෙන් දායක වූ වේදිකා නාට්‍යයක නම හා ඔහු රඟ පෑ චරිතය සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) හෙන්රි ජයසේන නිෂ්පාදනය කළ ස්වතන්ත්‍ර නාට්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) හෙන්රි ජයසේන ගෙන් දේශීය නාට්‍ය කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

(i) හුණුවටයේ කථාව - අසඩක්
මනමේ - මනමේ කුමාරයා
රත්නාවලී - උදයන රජතුමා
ජානකී (1951) - රාම
වැදගත්කම (1954) - රෝහණ විද්‍යාරත්න
කුවේනි (1963) - පූරක
ජනේලය (1962) - ආකාස මහත්තයා
හස්තිකාන්ත මන්තරය - උදයන රජ

**නාට්‍යයේ නම හා චරිතයේ නම සඳහන් කර ඇත්නම් ලකුණු 02 යි**

(ii) පව්කාරයෝ, ජනේලය, කුවේණි. තවත් උදෑසනක්, මනරංජන වැඩවර්ජන, අපට පුතේ මගක් නැතේ, සරණ සියොත් සේ පුතුනි හඹායන

**නාට්‍ය කෘති හතරක් නම් කර ඇත් නම් ලකුණු 04**

(iii) හෙන්රි ජයසේන නාට්‍ය රචකයකු/පරිවර්තකයකු/අනුවර්තකයකු/නළුවකු හා නිෂ්පාදකවරයකු වශයෙන් දේශීය නාට්‍ය කලාවට සිදු කළ සේවය විස්තර කර තිබිය යුතු ය.

- ස්වතන්ත්‍ර, අනුවර්තන, පරිවර්තන වශයෙන් නාට්‍ය රාශියක් නිෂ්පාදනය කිරීම
- බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් දේශීය නාට්‍ය කලාවට හඳුන්වාදීම
- නව අර්ථකථනයක්, නව දෘෂ්ටියක් පිළිබිඹු වන අයුරින් නාට්‍ය රචනය සහ නිෂ්පාදනය කිරීම (උදා :- කුවේණි)
- නාට්‍යධර්මී සම්ප්‍රදායෙන් දෛනික ජීවන ප්‍රශ්න නිරූපණය කරන නාට්‍ය නිර්මාණය කිරීම (උදා : ජනේලය)
- ගැමි ජන ජීවිතය ඇසුරින් නාට්‍ය නිර්මාණය කිරීම (උදා :- තවත් උදෑසනක්)
- විදේශීය නාට්‍ය කෘති පරිවර්තනය කොට නිෂ්පාදනය කිරීම (උදා :- මකරා, අහස් මාලිගා, හුණුවටයේ කථාව, දිරිය මව සහ ඇගේ දරුවෝ)
- නූර්ති නාට්‍ය නැවත නිෂ්පාදනය කිරීම (උදා :- සිරිසඟබෝ)

**ඉහත දැක්වෙන ආකාරයේ කරුණු 03 ක් සඳහන් කරමින් සේවය ඇගයීමට ලක් කොට ඇත්නම්**

**ලකුණු 06**

**7.** පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.
චතුරි විද්‍යා විෂයන් ඉගෙනගැනීමට කැමති ය. ඇගේ බලාපොරොත්තුව අනාගතයේ වෛද්‍යවරියක වීම යි. චතුරි ගේ නංගි සෙනුරි සංගීතයට සහ නර්තනයට දක්ෂ ය. ඇගේ බලාපොරොත්තුව කලා අංශයෙන් ඉගෙනගෙන ගුරුවරියක වීම යි. තාත්තා සෙනුරිට විද්‍යා අංශයෙන් ඉගෙන ගන්නා ලෙස බල කරයි. අම්මා සෙනුරි ගේ කැමැත්තට පක්ෂ ව කතා කරයි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
(iii) කුතුහලය සහ චරිතයක නොසිතු පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

**දෙන ලද කථා සාරාංශය ඇසුරු කරගෙන**

(i) පසුබිම, කාලය, චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කර තිබීම සඳහා **ලකුණු 04**

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථා ගොඩනංවා තිබීම සඳහා

**ලකුණු 04**

(iii) නාට්‍යෝචිත අවස්ථා සහිත ව නිර්මාණය කරතිබීම සඳහා

**ලකුණු 04**

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- ☐ 10-11 සිංහල ව්‍යාකරණ
- ☐ 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- ☐ බුද්ධ ධර්මය
- ☐ කතෝලික ධර්මය
- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ සිංහල සාහිත්‍යය සංග්‍රහය
- ☐ English Language
- ☐ ගණිතය - 1
- ☐ ගණිතය - 2
- ☐ ජීව විද්‍යාව
- ☐ භෞතික විද්‍යාව
- ☐ රසායන විද්‍යාව
- ☐ ඉතිහාසය
- ☐ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- ☐ භූගෝල විද්‍යාව
- ☐ පුරවැසි අධ්‍යාපනය
- ☐ පෙරදිග සංගීතය
- ☐ නර්තනය
- ☐ නාට්‍ය හා රංග කලාව
- ☐ චිත්‍ර කලාව
- ☐ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ☐ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ☐ සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- ☐ කෘෂි හා ආහාර තාක්ෂණය
- ☐ ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ බුද්ධ ධර්මය
- ☐ ඉතිහාසය
- ☐ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- ☐ පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- ☐ Buddhism
- ☐ Mathematics - 1
- ☐ Mathematics - 2
- ☐ Biology
- ☐ Physics
- ☐ Chemistry
- ☐ History
- ☐ Business & Accounting Studies
- ☐ Geography
- ☐ Civic Education
- ☐ ICT
- ☐ Health & Physical Education
- ☐ 10-11 English Literary (Poetry)
- ☐ 10-11 English Literary (Drama)
- ☐ 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- ☐ Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- ☐ බුද්ධ ධර්මය
- ☐ කතෝලික ධර්මය
- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ සිංහල සාහිත්‍යය සංග්‍රහය
- ☐ සිංහල රචනා අත්වැල
- ☐ English Language
- ☐ ගණිතය - 1
- ☐ ගණිතය - 2
- ☐ ජීව විද්‍යාව
- ☐ භෞතික විද්‍යාව
- ☐ රසායන විද්‍යාව

ඉතිහාසය

ඉතිහාසය රූප සටහන් ඇසුරින් කෙටි සටහන්

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2

භූගෝල විද්‍යාව

පුරවැසි අධ්‍යාපනය

පෙරදිග සංගීතය

නර්තනය

නාට්‍ය හා රංග කලාව

චිත්‍ර කලාව

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය

කෘෂි හා ආහාර තාක්ෂණය

ගෘහ ආර්ථික විද්‍යාව

ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

සිංහල භාෂාව හා සාහිත්‍යය

බුද්ධ ධර්මය

ගණිතය

විද්‍යාව

ඉතිහාසය

පුරවැසි අධ්‍යාපනය

භූගෝල විද්‍යාව

පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

10-ශ්‍රේණිය - විද්‍යාව

11-ශ්‍රේණිය - විද්‍යාව

# Grade 10 - Short Notes

**English Medium**

Buddhism

Mathematics - 1

Mathematics - 2

Biology

Physics

Chemistry

History

Business & Accounting Studies - 1

Business & Accounting Studies - 2

Geography

Civic Education

ICT

Health & Physical Education

# Grade 10 - Model Papers

**English Medium**

Mathematics

Science

Civic Education

Geography

English Activity Book

English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

හෙළදිව කතිකාවත
- අරුණශාන්ත අමරසිංහ

හොල්මන් අවතාර සහ යකදුරන්
- අරුණශාන්ත අමරසිංහ

සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.